එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය සම්බන්ධයෙන් අරුණ සහ මව්බිම පුවත්පත් තුළ මුල්පිටු පුවත් වාර්තාවන් පළවී තිබිණි.

මව්බිම මගින් "එජාප නායක කරු?" ලෙසින් ප්‍රශ්නාර්ථයක් සමගින් වූ සිරස්තලයකින් යුතුව දක්වා තිබූ පුවත් වාර්තාවේ, එජාප නායකත්වය සඳහා කරු ජයසූරිය මහතා පූර්ණ එකඟත්වය පළ කර ඇතැයි අනාවරණය වන බව දක්වන්නේ, ඔහුට සමීප ආරංචි මාර්ග මූලාශ්‍ර ලෙසින් දක්වමිනි.

මේ අතර "එජාප නායක කරු, ලේකම් මංගල" යන සිරස්තලයෙන් යුතු අරුණ ලිපිය එය ස්ථිර කරුණක් ලෙසින් දක්වන නමුත්, එම තොරතුරු ලබාගත් ආකාරය සම්බන්ධයෙන් කිසිදු මූලාශ්‍රයක් නොදක්වයි.
මෙම සිරස්තල දෙකින් මේ මොහොතේ වඩාත් නිවැරදි යැයි ඔබ තෝරාගන්නේ කුමක්ද?

#MediaEthicsSL #lka #SinhalaPress #News #Mawbima #Aruna